# 18.05.2015 වන අද දින යුද්ධයේ අවසන් අදියරේදී මරණයට පත්වූ අපගේ හිතවතුන් සැමරීම සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යතුමගේ ප්‍රකාශය

අද, යුද්ධයේ අවසන් අදියරේදී මරණයට පත්වූ අපගේ හිතවතුන් සමරණ දිනයයි. වසර හයකට පෙර ශ්‍රී ලංකාවේ පමණක් නොව විදේශයන්හි ජීවත්වන දෙමළ ජනතාවගේද හදවත් සසල කළ අප ජනතාවගේ ඛේද ජනක හා දුඃඛදායක ප්‍රවෘත්තිය අද දින ප්‍රකාශයට පත් කෙරේ. එබැවින් අද දිනය අප හට ඉතා වැදගත් හා හැඟුම්බර දිනයක්වනු ඇත.

මුල්ලියාවෙක්කාල් සිද්ධිය අප ජනතාවගේ සාමුහික මානව හෘද ශාක්ෂියේ නෙමැකෙන සටහන් ඉතිරි කොට ඇත. මානව අයිතීන් නොසලකූ මාධ්‍ය මැදිහත්වීම ප්‍රතික්ෂේපකළ මෙය ශාක්ෂි නොමැතිවූ යුද්ධයක් විය. එකී යුද්ධයේදී තහනම්කළ මාරක අවි භාවිතය සම්බන්ධයෙන් එකළ ජාත්‍යන්තර සංවිධාන බරපතල චෝදනා එල්ලකරන ලදි. ජාත්‍යන්තර ආධාර කොසලකා හරින ලද අතර ආහාර හා බෙහෙත් වැනි දේශීය ආධාර ප්‍රතික්ෂේපකරන ලදි. මුල්ලියාවෙක්කාල්හිදී මෙම ඛේදවාචකයට ගොදුරුව දිවිපිදූ අහිංසක කාන්තාවන්, ළමයින් හා දරුවන් ගේ සංඛ්‍යාව සම්බන්ධ අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත්විය. මුල්ලියාවෙක්කාල් සිදුවීම අප ජීවිතයේ හද කකියන ඓතිහාසික ඛේදජනක සිදුවීමක්වනු නොඅනුමානය.

යුද්ධයේදී දිවි පිදුවන් සිහිකිරීම අප විසින් සිදු කළයුතුව ඇත. එම දුඃඛිත සිදුවීම අප පත්ව සිටින ඛේදජනක තත්ත්වය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමේ පදනමක් ඇතිකොට ඇති අතර අපගේ අනාගත දේශපාලන ගමන් මගද එයින් නිරූපණය වේ.

වසර හයක් ගතවී ඇත . එකී කාලය තුළ මරණයට පත්වූවන් සම්බන්ධයෙන් සැබෑ තොරතුරු තවමත් නිසැකවම දැනගතයුතුව ඇත. අපරාධකරුවන් හඳුනාගැනීම සම්බන්ධ වාර්තා කිරීමට හා විමර්ශනය කිරීමට විනිවිදභාවයෙන් යුතු සත්‍යවාදී යාන්ත්‍රණයක් ක්‍රියාවට නැන්විය යුතුව ඇත. මේ සියල්ල ද්‍රවිඩ ජනතාවගේ හදවත්වල වේදනාවක් ඇති කොට ඇත.

ජාත්‍යන්තර හා දෙමළ සංවිධාන ඔවුනට හැකි පමණින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කණ්ඩායම මැදිහත්කරවීමට වෙර දැරුවද එහි ධනාත්මක ප්‍රගතියක් දක්නට නැත. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කණ්ඩායම රැස්වන සෑම වාරයකම දෙමළ ජනතාව ඔවුන්ගේ පාර්ශ්වයෙන් ධනාත්මක ප්‍රතිඵලයක් අපේක්ෂා කළත් අවසානයේදී ප්‍රමාදවීම් හා කල්දැමීම් සිදුවේ. යුක්තිය පමාවන විට යුක්තිය ඉටුනොවේ. ජාත්‍යන්තර ප්‍රජාව ඔවුන්ගේ විෂය පථයතුළ යුද්ධයේ අවසාන අදියරේදී මරණයට පත්වූ අහිංසකයන්හට සාධාරණත්වය ඉෂ්ට කිරීමට සෑම දෙයක්ම කළයුතුය යන්න අපගේ දෘෂ්ටියයි.

අපගේ ප්‍රයත්නය අපරාධකරුවන්ට දඬුවම් දීම පමණක් නොවේ. සත්‍යය ප්‍රකාශ කළයුතුව ඇත. එම නිසා අපගේ උතුරු පළාත් සභාව සමුලඝාතනය සම්බන්ධව ඒකමතිකව යෝජනාවක් සම්මත කළ අතර සත්‍ය වශයෙන් සිදුවූ දෙය සම්බන්ධව ලෝකයට දැනගැනීමට සලස්වන ලදි. තව දුරටත් පීඩාවටපත් වූවන්ට යුක්තිය ඉටුකිරීම මගින් අපගේ දේශපාලන ගමන්මගට එය ධෛර්යයක් වනු ඇත.

1948 නිදහස ලැබුදා පටන්ම දෙමළ ජනතාව ඔවුන්ගේ දේශපාලන ඉල්ලීම් ඉදිරිපත් කොට ඇත. අපගේම භාෂාවක්, ආගමක් ,සංස්කෘතියක්, සම්ප්‍රදායක්, ඉතිහාසයක් සහිත පෞරාණික ජනතාවක් වන අපි වියළි කලාපයේ වෙනම භූගෝලීය ප්‍රදේශයක ජීවත්වන්නෙමු. ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර ජීවත්වන අපට එම ප්‍රදේශවල විශාල බහුතරයක් හිමිය. බහුතර ජන කණ්ඩායම් වල ප්‍රබල දේශපාලන නායකයින් අපගේ ප්‍රශ්න සම්බන්ධව විසඳුමක් ඉදිරිපත් කිරීම දිගින් දිගටම නොසලකා ඇත.

දෙමළ ජනතාවගේ නීත්‍යානුකූල අයිතිය ඔවුන් විසින් පමා කොට හා ප්‍රතික්ෂේප කොට ඇත`. අනෙක් අතට ඔවුන් බහුතර ජන කණ්ඩායම්වල සමාජිකයිගෙන් සමන්විත ජනපද උතුරු හා නැගෙනහිර පළාත්වල ආරම්භ කරමින් එම ප්‍රදේශවල ජන ව්‍යාප්ති රටාව වෙනස් කිරීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකාවේ නව නායකයින් බලයටපත්වූ සෑම අවස්ථාවකම සාමය ප්‍රවර්ධනය කිරීම පිණිස ධනාත්මක සුලභ ප්‍රකාශයන් සිදු කරයි. මුලින්ම ඔවුන් දෙමළ භාෂාව කථාකරන ජනතාවගේ ප්‍රශ්න විසඳීම ගාම්භීරව භාර ගනී. කල්යත්ම ඔවුන් වෙනස් වේ. දෙමළ ජනතාවගේ ප්‍රශ්න ඔවුන්ගේ මනසින් දුරස් වේ. මෙතෙක් පැවති තත්ත්වය එයයි. මෙය ඉදිරියට ගෙනයාමට ඉඩ නොදිය යුතුය.

දැන් වාතාවරණය බොහෝ දුරට සුභවාදීය. ප්‍රමාදයකින් තොරව දෙමළ කතාකරන ජනතාව වෙනුවෙන් උපරිම වශයෙන් බලය විමධ්‍යගත කිරීමට අප කටයුතු කළ යුතුය. ප්‍රමාදය ප්‍රශ්නයේ ප්‍රමාණය තවදුරටත් වෙනස් කරයි. දෙමළ භාෂාව කතාකරන ජනතාවගේ දේශපාලන අභිලාශයන් සම්බන්ධයෙන් රජය ජාත්‍යන්තර ප්‍රජාව සමග තීරණයකට එළඹිය යුතුය. මෙයින් ශ්‍රී ලංකවේ නොයෙක් ජනසමූහයන් අතර සාමය හා අභිමානය ඇතිවේ. මේ ශෝචනීය දිනයේදී මෙකී භාවාත්මක වචන ස්වල්පය ඔබගේ දැඩි අවධානය පිණිස ඔබ හමුවේ තබමි.

ඔබට ස්තුතියි

විනිශ්චයකාර සී.වී.විග්නේශ්වරන්

ප්‍රධාන අමාත්‍ය

උතුරු පළාත